# ප්‍රසම්පාදන දැන්වීමයි

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

### ඌරගස්මංහන්දිය ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා ජල පිරිපහදු පද්ධතියක් ඉදි කිරීම

### ලංසු ඉදිරිපත් කළයුතු අවසාන දිනය : 2025.01.09 වන දින

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් වැඩ විෂයය සඳහා 2025.01.09 දින පෙ.ව **10.00** දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ. එදින එම වේලාවටම එම කාර්යාලයේදී ලංසු කරුවන් ඉදිරියේදී ලංසුපත් විවෘත කරනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ලියාපදිංචිය (CIDA) | ලංසු සුරක්ෂණය සහ වලංගු කාලය | ලංසු පත්‍ර ගාස්තුව රු. | පළපුරුද්ද |
|---|---|---|---|---|
| ඌරගස්මංහන්දිය ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා ජල පිරිපහදු පද්ධතියක් ඉදි කිරීම - කරන්දෙණිය ප්‍රාදේශීය සභාව **(G/KRPS/WTP/2024/001)** | ජල සම්පාදන සහ මලාපවහන ක්ෂේත්‍රයේ **CIDA ශ්‍රේණි C 5** හෝ ඉහළ ශ්‍රේණි සමඟ ලියාපදිංචිය | ලංසු සුරක්ෂණය රු.**500,000.00** **2025.05.07** දින දක්වා (ලංසු සුරක්ෂණයේ මුල් පිටපත ලංසුපතේ මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතුය.) | **12,500.00** | පසුගිය වසර **5** තුළ වැඩවලට සමාන ස්වභාවයක් සහ සංකීර්ණත්වයක් ඇති අවම වශයෙන් කොන්ත්‍රාත්තු **01** ක් **(Water Treatment Plant Structures)** ඉදිකිරීමේ පළපුරුද්ද හෝ **70%** ක් වැඩ අවසන් කිරීම |
| • ලංසු ඉදිරිපත් කිරීමට පෙර යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘතිය පිළිබඳව අවබෝධයක් ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂාවක් කරන ලෙස මෙයින් අවධාරණය කරනු ලැබේ. | | | | |

01. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ජල සැපයුම සහ මලාපවහන - Water Supply and Sewerage සඳහා ලියාපදිංචි (C5 හෝ ඉහළ) කොන්ත්‍රාත්කරුවන්ට මෙම කොන්ත්‍රාත්තුව පවරනු ඇත.

02. ලංසුපත් 2025.01.08 වන දින ප.ව **2.00** දක්වා කරන්දෙණිය ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත හැකිය.

03. ප්‍රසම්පාදනය සම්බන්ධ වැඩි විස්තර සතියේ වැඩ කරන දිනවල සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගත හැකිය.

04. ලංසුපත් ඉදිරිපත් කිරිමේ දී සෑම ලංසුවක් සමගම ඉහත වගුවේ සඳහන් ආකාරයට ලංසු ඇපකරයක් හෝ මුදල් තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඇපකරයක් නම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බැංකුවක් මගින් ලබාගෙන තිබිය යුතු අතර, එය කොන්දේසි විරහිත සහ ඉල්ලීම් කල විගස ප්‍රතිපූර්ණය කළ හැකි විය යුතුය. මෙම ඇපකරය ලංසුපතේ 09 වන කොටසේ සඳහන් ආකෘති පත්‍රය පරිදි "**ලේකම්,කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**" ලෙස සඳහන් විය යුතුය.

05. ඉදිරිපත් කරනු ලබන ලංසුපත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. ලංසුපත් පිටපත් දෙකකින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර එහි මුල් පිටපත සහ අනු පිටපත ලෙස සඳහන් කළ යුතු අතර අවසානයේ එක් කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. ලංසුපත් විවෘත කරන අවස්ථාවේ දී ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔහු වෙනුවෙන් බලය පවරන ලද නියෝජිතයකුට හෝ සහභාගි විය හැකි ය.

06. ලංසුවල වලංගු කාලය දින 90 කි.

07. පූර්ව ලංසු රැස්වීම 2025.01.03 දින පෙ.ව. 10.00 ට කරන්දෙණිය ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වේ.

08. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

2024.12.20

ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව,
මහඒදණ්ඩ,
කරන්දෙණිය.

දුරකථනය : **091-2291539**

E-mail : karandeniyaps@ymail.com